දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය }
எனது இல } NA/09/PBS(2023)/01/2022 වෙළුම - II
My No. }

ඔබේ අංකය }
உமது இல }
Your No. }

දිනය }
திகதி }2024.10. 02
Date }

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதாரஅமைச்சு
# Ministry of Health

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ජාතික රෝහල

අධ්‍යක්ෂ, ජාතික රෝහල, මහනුවර/ජාතික රෝහල ගාල්ල/ජාතික අක්ෂි රෝහල

රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්

මහ රෝහල්/දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන් හා වෛද්‍ය අධිකාරීවරුන්

විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන් හා මූලික රෝහල් ප්‍රධානීන් මගින්,

අදාළ හෙද නිලධාරීන්ට.

**<u>වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය (මාස 12) හා වින්නඹු කර්මය/මානසික හෙදකම (මාස 06) අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පශ්චාද් ප්‍රාථමික හෙද පුහුණුවට බඳවා ගැනීම 2023.</u>**

2023.02.02 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක 02-23/2023 මගින් උක්ත පාඨමාලාවට අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව, ලද අයදුම්පත් පිළිබඳ තොරතුරු හා පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ සාරාංශගත තොරතුරු පහත පරිදි ය.

01. පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ක්‍රමවේදය

I. I වන ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ (රෝහල් සේවා) තනතුරේ 2022.08.15 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව 199 කි. එයින් 65% ක් එනම් 131 ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව යටතේ බඳවා ගනු ලබන අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ දී ද දිස්ත්‍රික් පදනම යටතේ 65% අනුපාතය අදාළ වේ.

02. ලද අයදුම්පත් පිළිබඳ හා තෝරා ගැනීම පිළිබඳ තොරතුරු සාරාංශය

I. ලද අයදුම්පත් සංඛ්‍යාව 1451කි.

II. අයදුම්පත් යොමුකරන ලද අවස්ථාවේ දී පැවති ජ්‍යෙෂ්ඨතාව පදනම්කරගෙන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය සකස් කර ඇත.

III. ලද අයදුම්පත් ශ්‍රේණි අනුව වර්ගීකරණය පහත දැක්වේ. (වගු අංක 01)

වගු අංක 01

| ශ්‍රේණි අනුව සකස් කරන ලද සමස්ත අයදුම්පත් සාරාංශය | | |
|---|---|---|
| අනු අංකය | ශ්‍රේණිය | අයදුම්කරුවන් සංඛ්‍යාව |
| 1 | අධි ශ්‍රේණිය | 66 |
| 2 | 1 වෙනි ශ්‍රේණිය | 1201 |
| 3 | දෙවැනි ශ්‍රේණිය | 182 |
| 4 | ශ්‍රේණිය සඳහන් කර නැති | 02 |
| එකතුව | | 1451 |

IV. සුදුසුකම් නොලබා ඇති අයදුම්කරුවන් සහ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් 97 පිළිබඳ තොරතුරු (ඇමුණුම 01)

03. සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවීමට තීරණය කරන ලද අයදුම්කරුවන්

I. සුදුසුකම්ලත් අයදුම්පත් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැබී ඇති බැවින් II ශ්‍රේණියේ අයදුම්කරුවන් 180. (ඇමුණුම 02)

II. පුරප්පාඩු නොමැති දිස්ත්‍රික්ක සඳහා පමණක් අයදුම්කරන ලද අයදුම්කරුවන් 166 (ඇමුණුම 03)

4. ඉහත සියලු කරුණු කෙරෙහි අවධානය යොමුකිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට සුදුසුකම්ලත් අයදුම්පත් 1008 කි. ඒ අනුව, සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනය (ඇමුණම 04)

05. ඒ අනුව, පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කවලින් ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව යටතේ බඳවා ගැනීමට යෝජිත 131 දෙනෙක් තෝරා ගැනීම සඳහා අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨත්වය අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ අනුව, පළමු අවස්ථාවේදී පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව, සුදුසුකම්ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර, තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් පමණක් සෙසු අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. ඔබ විසින් සලකුණු කර ඇති දිස්ත්‍රික් මනාප ප්‍රකාශයන් හි කිසිදු වෙනසක් සිදුකිරීමට අවස්ථාව ලබා නොදෙන බව ද, නිසි පරිදි සම්පූර්ණ නොකිරීම මත ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් ද නැවත සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා නොදෙන බව ද තරයේ සැලකිය යුතු වේ.

07. එහෙත් ඇමුණුම් අංක 02 සිට 04 දක්වා පෙළගස්වා ඇති ලේඛනවල ඇතුළත් අයදුම්කරුවන්ගේ තොරතුරු සම්බන්ධව යම් ගැටලුවක්/නිවැරදි කිරීමක් හෝ සංශෝධනය කිරීමක් වේ නම්, ඒ පිළිබඳව තොරතුරු **2024/10/09** දිනට පෙර ආයතන ප්‍රධානී මගින්, nursingbranch1@gmail.com යන විද්‍යුත් තැපැල වෙත යොමුකිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ (පාලන) 01, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත, කොළඹ - 10 යන ලිපිනය වෙත යොමු කළ යුතු වේ.

08. එසේ යොමුකරනු ලබන ගැටලු/නිවැරදි කිරීම් හා සංශෝධන අනුව, අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛන සංශෝධන විය හැකි ය. ඒ අනුව, මෙහි ඇමුණුම 04 මගින් දක්වා ඇති ලේඛනය සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට අපේක්ෂිත අයදුම්කරුවන්ගේ තොරතුරු ඇතුළත් අවසන් ලේඛනය නොවන බව සැලකිය යුතු ය.

09. එසේම ඇමුණුම් අංක 04 මගින් දක්වා ඇති ලේඛනයේ සඳහන් අයදුම්කරුවන් සියලු ම දෙනා අදාළ බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම අනිවාර්යයයෙන් සිදුකරන බව, මෙහි සඳහන් කිසිදු වගන්තියකින් ප්‍රකාශිත නොවේ.

10. හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි මෙම පුහුණුවට බඳවා ගැනීම සඳහා නිකුත් කර ඇති උක්ත චක්‍රලේඛය මගින් ආවරණය නොවන යම් ගැටලු සහගත කරුණක් උද්ගත වුවහොත්, ඒ සම්බන්ධයෙන් සහ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්බන්ධයෙන් අවසන් තීරණය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය පී.ජී. මහීපාල

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය.

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA/09/PBS(2023)/01/2022 වෙළුම - II
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )
Date ) 02.10.2024

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

Deputy Director General (National Hospital of Sri Lanka)
Director, National Hospital Kandy, National Hospital Galle, National Eye Hospital
All Directors of Teaching Hospitals/General Hospitals
All Medical Superintendents of Base Hospitals /All Heads of Specialized Campaigns
All Heads of Institutions under the Line Ministry Through to the Concerned Nurses.

**Recruitment of the Post Basic Training for 1 ½ Years Diploma Course consisting Ward Management & Supervision (12 Months) and Midwifery/Psychiatric Nursing (06 Months).**

Applications were called for the above course by the General Circular Letter No.02-23/2023 dated 2023.02.02. Accordingly, in formation of the applications received and summarized information regarding filling of vacancies are as following.

01.Method of filling vacancies

I. The number of vacancies existing in Grade I and Supra Grade (Hospital Services) as at 15.08.2022 was 199. Out of them 65% that is, 131 will be filled on seniority and merits and, the percentage of 65% will be applied district wise for filling those vacancies.

02.Summary of information relating to applications and selection

I. No of applications received 1451.

II. List of names of the applicants has been prepared based on the seniority of the applicants at the time of submission of the application.

III. Applications received are categorized as following based on the Grade (Table No. 01).

Table No.01

| Summary of all applications prepared based on the Grade | | |
|---|---|---|
| Se. No. | Grade | No. of Applicants |
| 1 | Supra Grade | 66 |
| 2 | Grade I | 1201 |
| 3 | Grade II | 182 |
| 4 | Grade not indicated | 02 |
| Total | | 1451 |

IV. Information of disqualified applicants and rejected applications the number of which is 97 (Annexure 01).

03. Applicants not called for the interview.

I. 180 applicants in Grade II since a sufficient number of applications has been received from eligible applicants (Annexure 02).

II. 166 applicants who have applied only for the Districts where no vacancies are available (Annexure 03).

04. In view of all facts above 1008 applicants are eligible to be called for the interview. Seniority list prepared accordingly is given in Annexure 04.

05. Accordingly, applicants will be called for the interview on their seniority for the purpose of selecting the 131 applicants who are to be recruited on the seniority and merits from Districts where vacancies exist. First form the eligible applicants twice the number of vacancies will be called for the interview in the order of Seniority and other applications will be called from the interview only if vacancies are available further.

06. Special attention should be paid to the fact that applicants are not allowed to change the District preferences marked by them and no chance is given to complete again the applications which were rejected for not completing duly.

07. In case of any issue/rectification or alteration regarding the details of the applicants given in the Annexures from No. 02 to 04 particulars related thereto should be forwarded to reach the address Director (Admin) 01,"Suwasiripaya", No.385,Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10 on submission of the same to the email nursingbranch1@gmail.com through the Head of Institution before **09/10/2024**.

08. Respective seniority lists may be changed according to the issues/rectifications and alterations so forwarded. Accordingly, it should be noted that Annexure 04 which contains details of the applicants who are to be called for the interview shall not be the final list.

09.Nothing herein intends that all applicants whose names are given in Annexure No.04 are compulsorily called for the interview for recruitment.

10. If there arises any matter not provided for by the aforesaid circular which has been issued in accordance with the provisions of the Nursing Service Minute any such matter and the number of applicants called for the interview shall finally be decided by the Secretary of Health.

**Dr. P. G. Mahipala**
Secretary
Ministry of Health
"Suwasiripaya"
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha,
Colombo 10. Sri Lanka.

Dr. P.G. Mahipala
Secretary
Ministry of Health.